# ඇසළ උදාවයි, දහම් උදාවයි

පූජ්‍ය තිත්තගොනෑවේ සරණංකර හිමි



ඇසළ පුර පසාලොස්වක පොහෝ දිනය ලෝකවාසී බෞද්ධ ජනතාවට සුවිශේෂී දිනයකි. ශාසනික ඉතිහාසය මගින් හඳුන්වාදෙන්නේ මුළු මහත් විශ්වයටම බුදුරජාණන් වහන්සේගේ උතුම් සද්ධර්මය හිමි වූ දිනය වශයෙනි.

ගෞතම බුදුරජාණන් වහන්සේ විසින් සියලු සත්ත්වයන්ගේ හිතසුව පිණිස දම්සක් පැවතුම් සූත්‍ර දේශනා කළ පෙහොය, ඇසළ පොහොයයි. මෙදින මුළු මහත් විශ්වය පුරාම සාධු හඬ පැතිරී ගිය බව බණ පොත්වල සඳහන් වේ. එහි එන හැම කරුණකින්හ පැහැදිලි වන්නේ මිනිසාගේ මෙලොව, පරලොව යහපත අතිශයින්ම ඉවහල්වන කරුණුය.

බෞද්ධ අබෞද්ධ කා හටත් මෙහි එන කරුණු අර්ථ සහිතව මැනවින් අධ්‍යනය කිරීමෙන්, උතුම් යහපත්, හිතානුකම්පිත සමාජයක් ගොඩ නැංගවිය හැකිය.

බුදු සිරිතෙන් කෘතවේදී ගුණයක් සෑම මොහොතකම, ආදර්ශවත් බවක් ප්‍රකට වේ. එසේම ඒ, සෑම ක්‍රියාවෙන් ද, යාථාර්තයක් බවට පත්කළ සේක. සිද්ධාර්ථ බෝසතුන් තවුස්දම් රකින සමයේදී, තමන්ම ගුරුවූ ආලාරකාලාම. උද්ධකරාමපුත්ත, භග්ගව ධ්‍යානලාභී ගුරුතුමන්ලා පිළිබඳව විමර්ශනයක යෙදුන අතර, ඒඅ ය මියගිය බව, තමන් වහන්සේ දැනගත්සේක.

ඉන්පසුව තමන්ට උදව් උපකාරකළ ජීවමාන පිරිස වන, පස්වග මහණුන්ට, බරණැස  ඉසිපතනයේ මිගදා වනයේදී දම්සක් පැවතුම් සූත්‍රය දේශනා කිරීමෙන් කෘතවේදීත්වය ප්‍රදර්ශනය කලසේක. එම ශාසනික ක්‍රියාදාමයන් ඇසළ පොහෝදා සිදුවිය. මේ මගින් අපට, ක්‍රියාව වචනයට හෝ සිතිවිලිවලට පමණක් සීමා නොකර, ක්‍රියාව තුලින්ම කෘතවේදීත්වය දැක්වීමේ උතුම් ගුණය සනිටුහන් කෙරේ.

බුදුපියාණන් වහන්සේ පහළ වූ සමයෙහි සමස්ත භාරත සමාජයම ඉතා සංකීර්ණ වූවකි. එහි විවිධ ශාස්තෘන් අදහන පිරිස් ජීවත් වුනා. මිනිසාගේ උපත අනුව වර්ගීකරණය කළා. ඒ සියළු දෙනාට බුදුහාමුදුරුවන් පිළිතුරු දුන්නේ සත්‍ය ධර්මය අවබෝධකරලීමෙන්ය.

සමාජයේ ඇතැම් අය දමනය කිරීමට විවිධ උපක්‍රම පවා භාවිතා කිරීමට සිදුවුණා. එයින් තීර්ථක මානය බිඳ දැමීමට, යමා මහ පෙළහර පෑම අතිශයින්ම වැදගත් සිදුවීමකි. තීර්ථකයන් විසින් තමන් සතු විවිධ කාය ශක්තීන්, ග්‍රහ ශක්තීන් පෙන් වූ අවස්ථාවේදී  වඩා වැදගත් වනුයේ එබඳු දේ නොවන බවත්, ප්‍රඥාවන්ත වීම තුළින් සත්‍ය අවබෝධය බවත් වටහා දීම තුළින්ය. මෙම යමාමහ පෙළහර බුදු සමිඳුන්ට විනා ලොව අනිකකුට කළ නොහැකිය.

එක් රෝම කූපයකින් ජල කඳක්ද, තවත් රෝම කූපයකින් ගිනි කඳක්ද පිටවන ලෙස පෙන්වීම යමා මහ පෙළහර පෑමයි. ඒ තුළින් තීර්ථක මානය බිඳ ඔවුන් යහපත් මාර්ගයට පිවිසියා. එයද ඇසල පෝ දා සිදු විය.

සිරුරට අධික සැප දීමෙන්ද, අධික ලෙස දුක් දීමෙන්ද විමුක්තිය නොලැබෙන බව ලෝක සත්වයාට අවබෝධ කර දුන්නා. එම අන්ත දෙක අත්හැර මැදුම් පිළිවෙතකට පිවිසිය යුතු බව බුදුහිමියන් පෙන්වා දුන්නා. මෙම දහම ඇසල සෝදා ශ්‍රවණය කළ කොණ්ඩඤ්ඤ තවුසා සෝවා-න් ඵලයට පත්වුණා.

සිදුහත් බෝසත් කුමරු මහා මායා දේවියගේ කුස තුළ පිළිසිඳ ගැනීම, රාහුල කුමරුගේ උපත, සිදුහත් කුමරු අභිනික්මන් කිරීම, භික්ෂූන් වහන්සේලා පෙර වස් විසීම, බුදු හිමියන් පළමු වස් වැසීම, තව්තිසා දෙව්ලොවට වැඩ, මාතෘ දිව්‍ය රාජයාට අභිධර්මය දේශනා කිරීම ඇසළ පොහෝදා සිදු වූ වැදගත් සිදුවීම්ය.

ජීවිතය පිළිබඳව සත්‍යය ගැඹුරින්, තේරුම් ගැනීමට බුදුන් වදාළ ධර්මය අවබෝධ වේවා....

සැමට තෙරුවන් සරණයි.......





